මහ කොළඹ ආර්ථික කොමිසම (ම.ආ.කො.) කර්මාන්ත 52 ක් අනුමත කළ අතර එහි මුළු ආයෝජනය රුපියල් දශ ලක්ෂ 1624 ක් වෙ. මෙයින් සියයට 74 ක් විදේශීය ආයෝජන වූ අතර, මුළු විදේශීය ආයෝජනයෙන් අඩක් පමණ වැයවෙන කර්මාන්ත 32 ක්ම රෙදිපිළි හා ඇඳුම් පැළඳුම් කර්මාන්ත අංශයේය. දියුණු රටවල ප්‍රධාන වෙළඳපොළවලට සිය අපනයන ව්‍යාප්ත කිරීමේදී ප්‍රමාණාත්මක හා අනෙකුත් සීමාවන්ට මුහුණ දී ඇති රටවලින් මෙම විදේශීය ආයෝජන මෙහි පිවිසි අතර ශ්‍රී ලංකාව ඔවුනට සවකීය අපනයන ව්‍යාප්ත කිරීමට ඉඩ ප්‍රස්ථාව සලසා දුනි.

විදේශීය ආයෝජන උපදේශක කමිටුව (වි.ආ.ක.) කර්මාන්ත 21 ක් අනුමත කර ඇති අතර ඒවායේ මුළු ආයෝජනය රුපියල් දශ ලක්ෂ 121 කි. මින් තුනෙන් දෙකක් විදේශීය ආයෝජන වෙ. මුළු විදේශීය ආයෝජනයෙන් සියයට 32 ක් පමණ කෙරෙන කර්මාන්ත ආයතන 11 ක් ම රසායනික ද්‍රව්‍ය, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන අංශයෙහිය. විදේශීය ආයෝජනයෙන් තවත් සියයට 27 ක් පමණ කෙරෙන ආයතන 7 ක් රෙදිපිළි හා ඇඳුම් පැළඳුම් අංශයෙහිය. දේශීය ආයෝජන උපදේශක කමිටුව (දේ.ආ.ක.) විසින් අනුමත කළ කර්මාන්ත 2385 න් 1315 ක් නොහොත් සියයට 55 ක් පමණ වූයේ මුළුආයෝජනයෙන් සියයට 43 ක් පමණ වැයවන රෙදිපිළි සහ ඇඳුම් පැළඳුම් අංශයෙහිය. රසායන ද්‍රව්‍ය, නිමකළ ලෝහ භාණ්ඩ හා යන්ත්‍රෝපකරණ අංශයන්හි කර්මාන්ත 651 අනුමත කළ අතර, මුළු ආයෝජනයෙන් සියයට 27 ක් පමණ එහි විය. සාමාන්‍යයෙන් මහ කොළඹ ආර්ථික කොමිසමෙන් පිටත අනුමත කළ ආයෝජනවලින් බොහොමයක්ම රෙදිපිළි, ඇඳුම් පැළඳුම් අංශයෙහි විය. විදේශීය ආයෝජන උපදේශක කමිටුව මගින් අනුමත කළ කර්මාන්තවලින් බොහොමයක් අපනයන නැඹුරුවකින් යුක්තවූ මුත්, දේශීය ආයෝජන උපදේශක කමිටුව මගින් අනුමත කළ කර්මාන්ත බොහොමයක්ම දේශීය වෙළඳපල අරමුණු කරගත් ඒවා විය. දේශීය ආයෝජන උපදේශක කමිටුව මගින් අනුමත කළ කර්මාන්තවලින් යම් ප්‍රමාණයක් දියුණු ශිල්පක්‍රම භාවිතා වන රසායන ද්‍රව්‍ය, යන්ත්‍ර සූත්‍ර හා සූක්ෂම භාණ්ඩ නිෂ්පාදන අංශයන්හි විය.

කොළඹ නගරාසන්න ප්‍රදේශයෙහි කර්මාන්ත සංකේන්ද්‍රනයවීම කෙරේ බලධාරීන්ගේ අවධානය යොමු විය. මුළු කර්මාන්ත සංඛ්‍යාවෙන් සියයට 80 කටත් වඩා කොළඹ දිස්ත්‍රික්කයේ පිහිටා ඇති අතර මුළු නිපැයුමෙන් සියයට 90 ක් මෙම කර්මාන්තවල කෙරෙන අතර සේවක සංඛ්‍යාවෙන් සියයට 81 ක් එහි වන බවත් සමීක්ෂණයකින් හෙළි වී ඇත. ප්‍රාදේශීය වශයෙන් කර්මාන්ත වඩාත් සමබරව ව්‍යාප්ත කිරීම සඳහා බදු සහ වෙනත් පහසු-කම් කිහිපයක්ම ප්‍රදානය කිරීම කෙරෙහි අවධානය යොමුවෙමින් පවතී. එහෙත් නූතන කර්මාන්ත බොහොමයක් තැනින් තැන ගෙන යාමට ඇති පහසුව නිසා ස්ථාන ගතවීමේ දී නම්‍යතාවයක් පෙන්වයි. එබඳු කර්මාන්තවලට මෙවැනි පහසුකම් බලපානු ඇත්තේ අල්ප වශයෙනි. එම නිසා කර්මාන්ත ප්‍රාදේශීය වශයෙන් ව්‍යාප්ත කරලීම සඳහා කොළඹ දිස්ත්‍රික්කයෙන් පිටත ආයෝජන කිරීම ආකර්ෂණීය වන සේ අවශ්‍ය ව්‍යුහමය පහසුකම් සහිත ප්‍රාදේශීය කාර්මික මධ්‍යස්ථාන පිහිටුවීම යෝග්‍ය වනු ඇත.

## මිල

ශ්‍රී ලංකා ආර්ථිකයේ මිල මට්ටමේ සිදුවන වෙනස්වීම් පෙන්නුම් කිරීම සඳහා ප්‍රසිද්ධ කරන ලද දර්ශකයන් වශයෙන් ඇත්තේ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව පිළියෙල කරන කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකයත්, මහබැංකුව මගින් සකස් කරනු ලබන තොග මිල දර්ශකයත් පමණි. මින් කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය සිල්ලර මිල ගණන්වල වෙනස්වීම් දක්වන අතර, එය 1978 දී සියයට 12·1 ක වැඩිවීමක් පෙන්නුම් කරයි. පසුගිය වර්ෂ දෙකෙහි මෙහි වැඩිවීම සියයට 1·2 ක් විය. මෙම දර්ශකයේ ඇති ඌණතාවන් පසුගිය වර්ෂවල ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාවන්හි දක්වා ඇත. අනෙක් අතට තොග මිල දර්ශකය[1] 1977 පෙන්නුම් කරන ලද සියයට 20·8[2] ක වැඩිවීම හා සසඳන විට


1. භාණ්ඩයක අලෙවි ක්‍රියාවලියේ ප්‍රථම වාණිජ හුවමාරු අවස්ථාව ප්‍රාථමික වෙළඳ හුවමාරු අවස්ථාව වශයෙන් සලකනු ලැබේ. මේ නිසා දේශීය නිෂ්පාදිතයන්හි නිෂ්පාදකයන්ගේ මිල ගණන් සහ ආනයනය කළ භාණ්ඩයන් හි ආනයන මිළ ගණන් තොග මිළ යනුවෙන් අදහස් කෙරේ. මෙලෙස සාමාන්‍ය ව්‍යවහාරයේදී තොග මිළ යනුවෙන් අදහස් කරන දෙයට වඩා මෙය වෙනස් බව සඳහන් කළ යුතුය.

2. සංශෝධිත දර්ශකය අනුව.

## තොග අලෙවි මිල දර්ශකය

1974 =100


1975 වාර්ෂික; 1976 සිට මාසිකව




ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## වැටුප් ප්‍රමාණ දශීක අංක
1952 = 100




ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

1978 පෙන්නුම් කරන්නේ සියයට 15·8 ක වැඩිවීමකි. මෙම දර්ශකයන් දෙක අනුව බලන විට සමාලෝචනයට භාජනය වන වර්ෂ තුළදී ආර්ථිකයේ මිල මට්ටමේ වර්ධනය සමතුලනය වී ඇති බවට නිගමනය කළහැක. තවද වර්තන මිල ගණන් අනුව වූ දළ ජාතික නිෂ්පාදිතයේත්, 1959 ස්ථාවර මිල මට්ටම අනුව වූ දළ ජාතික නිෂ්පාදිතයේත් අනුපාතිකය වන ගම්‍ය මිල දර්ශකය අනුව 1978 වර්ෂයේ දී මිල මට්ටමේ වැඩිවීම සියයට 15 ක් බව දක්වයි. පසුගිය වර්ෂයේ සියයට 16 ක් වූ මෙම දර්ශකයේ වැඩිවීම අනුව සසඳන විට ඉහත සඳහන් නිගමනය තව දුරටත් සනාථ වෙයි.

මෙම දර්ශකයන් දෙස බලන විට 1978 වර්ෂයේ දී ආර්ථිකයේ උද්ධමන වේගය සියයට 15 ටත්, සියයට 16 ටත් අතර පැවති බව පෙන්වයි. මේ අනුව පසුගිය වර්ෂයේ උද්ධමන වේගය වූ සියයට 16 ත්, සියයට 20 ත් අතර ප්‍රමාණය අනුව සසඳන විට 1978 දී උද්ධමන වේගයේ අඩුවීමක් පෙන්නුම් කරයි. මේ අනුව මිල මට්ටමේ ඉහළනැගීමකට තුඩුදුන් විචල්‍යයන්වූ විනිමය අනුපාතිකයේ සැළකියයුතු අඩුවීමත්, 1977 නොවැම්බර් මාසයේ සිට ක්‍රියාත්මක වූ භාණ්ඩ විශාල සංඛ්‍යාවක් සඳහා වූ මිල පාලනයන් ඉවත් කිරීමත්, 1977 දෙසැම්බර් මස සිට පෞද්ගලික අංශයේ හා රාජ්‍ය අංශයේ සේවකයින්ගේ වැටුප් වැඩි කිරීමත්, 1978 දී ගෘහස්ථ ඒකකයන් විශාල සංඛ්‍යාවකගේ සහල් සහ සීනි සහනාධාරය ඉවත් කිරීමත්, 1978 දී අවස්ථා 3 කදී පිටිමිල වැඩිකිරීමත් යන මෙවැනි බලපෑම් අනෙකුත් සාධක මගින් තුලනය වී ඇති බව පෙනේ. මෙම අනෙකුත් සාධක අතර, නිදහස් වෙළඳ ප්‍රතිපත්තිය නිසා භාණ්ඩ සුලභ වීමත් ආනයන සහ භාණ්ඩ බෙදා හැරීමේ වෙළඳ පොලෙහි වඩා තරඟකාරී තත්ත්වයක් ඇතිවීමත් සැළකියයුතු ප්‍රමාණයකින් ලොරි ඇතුළු වාහනවල සැපයීමේ වැඩිවීම නිසා වූ ප්‍රවාහන පහසුකම්වල දියුණුවත්, සහල් ඇතුළු ප්‍රධාන පාරිභෝගික භාණ්ඩවල වැඩි නිෂ්පාදනයත් භාණ්ඩ බොහොමයක් සඳහා වූ ව්‍යාපාර පිරිවැටුම් බදු ප්‍රමාණයන් සහ තීරුබදු ප්‍රමාණයන් අඩු කිරීමත්, සාපේක්ෂ වශයෙන් මුදල් සැපයීම වැඩිවීමේ වේගය පෙර වර්ෂ හා සසඳන විට අධික නොවීමත් (1978 මුදල් සැපයීමේ වැඩිවීම සියයට 11 ක් වූ අතර එය පසුගිය වර්ෂයේ දී සියයට 29 ක් විය.) යනාදිය විය. එසේ වුවද, සියයට 10 කට වඩා වැඩි උද්ධමනකාරී වේගයක් පැවතීම සතුටුවිය හැකි කරුණක් නොවේ. එයට හේතුව අපනයන පදනම් වූ ආර්ථික වර්ධනයක් ළඟාකර ගැනීමට බලාපොරොත්තු වන ආර්ථිකයක පිරිවැය ඉහළ යාම වළක්වා ගැනීම මූලික අරමුණක් වියයුතු හෙයිනි. අපනයන අංශයේ පරිවර්තනයක් කිරීමට නම් රටකට ජාත්‍යන්තර වෙළඳපොලේ තරඟකාරීව රැඳී සිටියයුතු බව කීම අනවශ්‍යය.

### තොග මිල දර්ශකය

තොග මිල දර්ශකය දෙවන කාර්තුවේ දී සියයට 2·2 කින් පහත වැටී ඇති බව කාර්තුගත දත්ත නිරීක්ෂණයකින් පෙන්නුම් කරයි. දර්ශකය තෙවන හා සිවුවන කාර්තුවලදී පිළිවෙලින් සියයට 2·8 සහ සියයට 5·8 බැගින් ඉහළ යමින් එහි උපනතිය වෙනස් වී ඇත. ආහාර සහ විවිධ ගණයන්ට අයත්වන භාණ්ඩයන්හි මිල දෙවන කාර්තුවේ දී අඩුවිය. තෙවන කාර්තුවේ දී රෙදිපිළි, පාවහන් සහ විවිධ භාණ්ඩ හැර අනෙකුත් සියළුම භාණ්ඩ කාණ්ඩයන් හි මිල වැඩිවිය. සිවුවන කාර්තුවේ දී රසායන හා රසායනික නිෂ්පාදන කාණ්ඩය හැර අනෙකුත් සියළුම උප කාණ්ඩයන් හි මිල වැඩිවීම වාර්තා විය.

තොග මිල දර්ශකය තව දුරටත් නිරීක්ෂණය කිරීමේ දී රෙදිපිළි සහ පාවහන්, කඩදාසි නිෂ්පාදන, රසායන හා රසායනික නිෂ්පාදන, ලෝහ නොවන නිෂ්පාදන, ලෝහ නිෂ්පාදන, ඉන්ධන හා විදුලිය සහ විවිධ ගණයන්ට අයත්වන භාණ්ඩයන්හි මිල මට්ටම සියයට 20 සිට 48 දක්වා ඉහළ ගොස් ඇති බව පෙන්වයි. ආහාර, මද්‍ය පාන, විදුලි භාණ්ඩ සහ යන්ත්‍රෝප කරණ යනාදියේ මිල සියයට 5 සිට සියයට 11 දක්වා වූ වර්ධනයක් පෙන්නුම් කරන අතර, ඛණිජ තෙල් නිෂ්පාදනවල මිල නො වෙනස්ව පැවතුනි.

ආහාර කාණ්ඩය තුළ සහල්, තිරිඟු පිටි සහ සීනිවල ආනයන මිළෙහි තියුණු වැඩිවීමක් පෙන්නුම් කරයි. අනෙකුත් සැළකිය යුතු මිළ වැඩිවීම් සිදුව ඇත්තේ සෝගම් (30%), බඩ ඉරිඟු (49%), හරක් මස් (27%), බිත්තර (24%), මාළු (32%), ගම්මිරිස් (25%), අබ (55%) සහ උම්බලකඩ (187%) යන භාණ්ඩවලය. මධ්‍යස්ථ මිළ වර්ධනයන් වාර්තා කළ

භාණ්ඩ නම් විවෘත වෙළඳපොලේ වී (13%), කුරක්කන් (18%), කුකුල් මස් (2%), කරවල (18%), අර්තාපල් (6%), පොල් (12%), කොත්තමල්ලි (11%), කිරි (5%) සහ උකුකිරි (13%) යනාදියයි. මෙම මිල වැඩිවීම්වල බලපෑම මුංඇට (19%), සෘතුමය නොවන එළවළු (2%), වියලි මිරිස් (22%), රතුලූනු (8%), තේ (15%) සහ කෝපි (36%) යනාදියේ මිල අඩුවීම් වලින් සැහෙන දුරට සමහන් විය. එහි ප්‍රතිඵලය වූයේ ආහාර මිල සාමාන්‍යයෙන් සියයට 10 කින් පමණ වැඩිවීමකි.

ආංශික වර්ගීකරණයෙන් පෙන්නුම් කරන පරිදි දේශීය කාණ්ඩයට අයත් භාණ්වල මිල 1978 වර්ෂයේ දී සියයට 16 කින් වැඩිවී ඇත. පසුගිය වර්ෂයේ දී මෙම කාණ්ඩයේ මිලෙහි වැඩිවීම සියයට 9 ක් පමණ විය. මේ අතර ආනයන කාණ්ඩයේ උප දර්ශකය පසුගිය වර්ෂයේ සියයට 3 ක අඩුවීමක් දක්වූ අතර, මෙම වර්ෂයේ දී සියයට 49 ක වැඩිවීමක් පෙන්නුම් කරයි. අනෙක් අතට 1977 දී සියයට 59 කින් වැඩි වූ අපනයන භාණ්ඩ සඳහා වූ උප දර්ශකය මෙම වර්ෂයේ දී ස්ථාවරව පැවැතිණි. සමාන සංසන්දනයක් අනුව පාරිභෝගික කාණ්ඩයට අයත් භාණ්ඩ සඳහා වූ උප දර්ශකය සියයට 12 කින් වැඩිවී ඇති අතර අන්තර් භාණ්ඩ සහ ආයෝජන භාණ්ඩ සඳහා වූ උප දර්ශකයන් සියයට 30 බැගින් වැඩිවී ඇත.

## මිල පාලන හා සලාක

1977 ආර්ථික සංශෝධනයේ කොටසක් වශයෙන් භාණ්ඩ බොහොමයක් සඳහා පැවැති මිල පාලනය ඉවත් කරන ලදී. 1978 දී කොත්තමල්ලි මිල පාලනයෙන් ඉවත් කළ අතර, මිල පාලනය සඳහා කිසිදු භාණ්ඩයක් අළුතින් ඇතුලත් නොකරන ලදී. තිරිඟු පිටි, පාන්, මුං පරිප්පු, කිරි යනාදියේ පාලන මිල වැඩි කරන ලදී.

අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය බෙදහැරීම සහ සලාක ක්‍රමය සඳහා වූ වැඩ පිළිවෙල 1977 නොවැම්බර් මාසයේ ප්‍රකාශයට පත් කරන ලදුව, 1978 පෙබරවාරි මස සිට ක්‍රියාත්මක කරන ලදී. නව වැඩ පිළිවෙල යටතේ සලාක මත සහල් සහනාධාර නිකුත් කිරීම මුළු ජනගහණයෙන් අඩක් ඇතුළත් වන පරිදි අඩු ආදයම් උපයන්නන් (අවුරුද්දට රු. 3,600/—කට අඩු) කණ්ඩායමකට පමණක් සීමාකරන ලදී. සීනි සලාකය මෙම කොටසට අයත් ළමයින්ට පමණක් සීමා විය. එහි ප්‍රත්ඵලයක් ලෙසු සහල් වෙළඳාමේ විශාල කොටසක් ක්ෂණිකව නිදහස් වෙළඳ පොල යටතට පත් වූ අතර, එය ඉතා කාර්යක්ෂම පරිදි ක්‍රියාත්මක වී ඇති බව පෙනේ. මේ අනුව නිදහස් වෙළඳපොලේ සාමාන්‍ය වර්ගයේ සහල් සේරුවක මිල රු. 2·90 ත්, රු 3·20 ටත් අතර ස්ථායී මිලකට නැඹුරු වී ඇත.

නිදහස් වෙළඳ ක්‍රමයේ ක්‍රියාකරිත්වයට බාධා නොවන පරිදි හා පාරිභෝගිකයා සූරා කෑමෙන් වැළැක්වීමේ අරමුණ ඇතිව පාරිභෝගික ආරක්ෂක නීති 1978 දී ඇති කරන ලදී. ජාතික මිල කොමිසම තම කාර්යයන් සාමාන්‍යයෙන් පොදු ව්‍යවසායයන් හි මිල නියම කිරීමට පමණක් සීමාකොට ඇත.

## වැටුප්

මහබැංකු දර්ශකයට අනුව 1977 දී සියයට 5 කින් ඉහළ ගිය රජයේ සේවකයින්ගේ අවම වැටුප් නැවත වරක් 1978 දී සියයට 15 කින් පමණ ඉහළ යන ලදී. ලිපිකාර හා කාර්මික සේවකයන්ගේ නාමික වැටුප් අනුපාතය 1977 දී සියයට 1 කින් වැඩිවීම හා සසඳන විට 1978 දී සියයට 12 කින් වැඩිවිය. මෙපරිදිම සුළු සේවකයන්ගේ හා පාසැල් ගුරුවරුන්ගේ වැටුප් පසුගිය අවුරුද්දේ සියයට 2 බැගින් වැඩිවීම හා සසඳන විට මෙම වර්ෂයේ පිළිවෙලින් සියයට 16 හා සියයට 10 බැගින් ඉහළ යන ලදී. මූල්‍ය වැටුප් අනුපාතයන්හි මෙම වර්ධනයන්ට ප්‍රධාන හේතුව නම් 1977 දෙසැම්බර් මාසයේදී රාජ්‍ය සේවකයින්ගේ වැටුප් වැඩි කිරීමයි. පසුගිය අවුරුද්දට වඩා මූල්‍ය වැටුප් සැළකිය යුතු ලෙස වැඩි වූ නමුත් 1978 වර්ෂය පුරාම ස්ථාවරව පැවැත ඇත. 1978 නොවැම්බර් මස ප්‍රකාශයට පත් කළ වැටුප් වැඩිවීම ක්‍රියාත්මක වූයේ 1979 වර්ෂයේ දීය. ආර්ථිකයේ උද්ධමන වේගය අත්හල විට මෙම අංශයේ මූර්ත වැටුප් සුළු සේවකයන්ගේ හැරුන විට අඩුවීමක් පෙන්නුම්කරයි.